බාලවයස් ලිංගික අපයෝජනයක් වගකීමෙන් යුතුව වාර්තා කරමු!

මීට මාස දෙකකට පමණ පෙර මවක් විසින් මුල්ලේරියාව පොලිසියට කළ පැමිණිල්ලක් මත, අතුරුදන්ව සිටි ඇයගේ 14 හැවිරිදි බාල වයස් පුත්‍රයා සහ වයස අවුරුදු 24 ක අයෙකු පොලිස් අත්අඩංගුවට පත්වීම සම්බන්ධ පුවතක් දිනමිණ සහ මව්බිම වාර්තා කර තිබිණි.

එහිදී එම බාලවයස්කරු සහ අනෙකුත් සැකකරු අතර ලිංගික ඇසුරක් ("සමලිංගික ඇසුරක්"/"අස්වාභාවික හැසිරීම් වල යෙදීමක්" ලෙසින් පුවත් වාර්තාවන්හි සඳහන්වේ) තිබූ බවද වාර්තා කෙරේ.

ඔබ සිතන ලෙසට,

1) බාලවයස්කරුවෙකුගේ කැමැත්තෙන් ලිංගික ඇසුරක් පැවැත්වූවද, එය නීතියට අනුව වරදක්, එනම් බාලවයස් ලිංගික අපයෝජනයක් වේ. එසේ නම්, මෙම දිනමිණ හෝ මව්බිම පුවත තුළ මෙය බාලවයස් ලිංගික අපයෝජනයක් හෝ "ව්‍යවස්ථාපිත ලිංගික අපරාධයක්" බව සඳහන් නොවන්නේ මන්ද?

2) බාලවයස් ලිංගික අපයෝජනයට නොව සමරිසි සබඳතාවයට මෙම පුවත් වාර්තාවන් තුළ වැඩි බරක් ලබාදීම ඔස්සේ, බාලවයස් ලිංගික අපයෝජනයක් සැහැල්ලු කොට දැක්වීමක් මෙහිදී සිදුවී නැතිද? ඒ ඔස්සේ බාලවයස් ලිංගික අපයෝජනයන් සැහැල්ලුවෙන් ගන්නා ආකල්පයක් සමාජගත වීම සහ එය සාමාන්‍යකරණය වීම සිදුවනු නැතිද?

3) මෙහිදී සිදුව ඇත්තේ බාලවයස් ලිංගික අපයෝජනයක් වුවත්, සමරිසි සබඳතාවයක් "අස්වාභාවික හැසිරීම් වල යෙදීමක්" ලෙසින් චිත්‍රණය කිරීම ඔස්සේ, පොදුවේ සමරිසි ලිංගික දිශානතියකින් යුතු අයව කොන් කිරීමේ ආකල්පයන්/හෝමොෆෝබියා (homophobic) ආකල්පයන් තීව්‍ර කිරීමට හේතුවක් නොවන්නේ ද?

